# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2138/36 - 2019 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2019.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2019 අංක .............. දරන

ඌව පළාත් සභාවේ මාර්ග (සංශෝධන) ප්‍රඥප්තිය කෙටුම්පත

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වීමෙන් පසු දින 14 ක් ඉක්ම ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 14 ක් තුළ දී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතු ය.

අකලන් සෙන්දිල් තොන්ඩමාන්,
මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, වතු යටිතල
පහසුකම්, සමුපකාර සහ ද්‍රවිඩ මාධ්‍ය අධ්‍යාපන අමාත්‍ය,
ඌව පළාතේ පළාත් සභාව,
බදුල්ල.

2019 ක් වූ අගෝස්තු මස 21 වැනි දින,
මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, වතු යටිතල
පහසුකම්, සමුපකාර සහ ද්‍රවිඩ මාධ්‍ය අධ්‍යාපන අමාත්‍යාංශය,
බදුල්ල, ආර්. එච්. ගුණවර්ධන මාවතේ පිහිටි,
අමාත්‍ය කාර්යාලයේ දී ය.


1A - PG 4632 — 20 (2019/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඌව පළාතේ පළාත් සභාවේ**

**2019 අංක ...... දරන ඌව පළාත් සභාවේ මාර්ග (සංශෝධන) ප්‍රඥප්තිය**

2010 අංක 02 දරන ඌව පළාත් සභාවේ මාර්ග ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පළාත් සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2019 අංක .......... දරන ඌව පළාත් මාර්ග (සංශෝධිත) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස එය ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද දින සිට හෝ තීරණය කරන ලද දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බව ද සළකනු ලැබිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන) 2010 අංක 02 දරණ ඌව පළාත් මාර්ග ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුලත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන උප වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

පළාත් මාර්ගයක් බවට ප්‍රකාශයට පත් කිරීම.

3. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් මගින් (මෙහි මින් මතු "අමාත්‍යවරයා" යනුවෙන් හඳුන්වනු ලබන) ඌව පළාත් සභාවේ මාර්ග විෂයය භාර අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ 6 වන උප වගන්තියේ බලතල ප්‍රකාරව කිසියම් මාර්ගයක් ඌව පළාත් සභාවට අයත් මාර්ගයක් ලෙසට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය. එකී සෑම මාර්ගයක්ම "සී" හෝ "ඩී" හෝ "ආර්" පංතියේ මාර්ගයක් ලෙස ශ්‍රේණිගත කරනු ලැබිය යුතුය. එසේම ප්‍රධාන ප්‍රඥප්තියේ "ඊ" ශ්‍රේණියේ මාර්ග ලෙස හඳුන්වන ලද සියලු මාර්ග මින්මතු "ආර්" ශ්‍රේණියේ මාර්ග ලෙස හඳුන්වනු ලැබිය යුතුය.

(2) පළාත් මාර්ග ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක අමාත්‍යවරයා විසින් නියෝග මගින් පැනවිය හැකිය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ), (ආ) හා (ඇ) උප වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26 (1) යටතේ (අ) සහ (ආ) ලෙස බලපැවැත්විය යුතුය.

1. එම වගන්තියේ (1) වන උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

ගොඩනැගිලි තැනීමේ සීමා හා බර සීමා

(1) (අ) පළාත් මාර්ගයක් ලෙස මාර්ග අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගයක් සම්බන්ධයෙන් වන විට ඒ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට මාර්ගයේ දෙපසටම, පළාත් මාර්ග අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන දුර ප්‍රමාණයෙන් ඉදි කිරීම් කළ හැකි සීමාව ද, එමෙන්ම ද්‍රව්‍ය, මිනිසුන් හා සතුන් ඇතුළුව පටවන ලද සම්පූර්ණ බර සමග වාහනයේ බර සීමාව ද පළාත් මාර්ග අධ්‍යක්ෂ විසින් ගැසට් පත්‍රයේ පළ කර නියම කළ යුතුය.

(ආ) ඉහත (අ) ඡේදය මගින් නියම කරනු ලබන සීමාවන් යම් මාර්ගයකට හෝ එහි යම් කොටසකට හෝ කොටස් වලට වෙන් වෙන් වශයෙන් හෝ නියම කළ හැකිය.

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 26(4) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26 (4) වන උප වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

(4) ඉහත (1) උප වගන්තියෙන් නියම කරනු ලබන සීමාවන් ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් භාර ප්‍රධාන ඉංජිනේරුවරුන් දෙදෙනා ඇතුළුව පළාත් මාර්ග අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් ලබා ගන්නා නිර්දේශ සළකා බැලීමෙන් අනතුරුව පළාත් මාර්ග අධ්‍යක්ෂ විසින් සංශෝධනය කරනු ලැබිය හැකි අතර,එම සංශෝධන ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමක් මගින් සංශෝධනය කළ හැකිය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 26(6) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26 (6) වන උප වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

(6) පළාත් මාර්ගයක් ලෙස අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගයක් මත භාවිතා කරන වාහනයක් සම්බන්ධයෙන් එම වාහනයේ තිබිය හැකි උපරිම දිග, පළල හා උස පළාත් මාර්ග අධ්‍යක්ෂ විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මඟින් නියම කළ යුතුය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 26(7) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26 (7) වන උප වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

(7) මෙම වගන්තිය යටතේ පළාත් මාර්ග අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන බර සීමාවන් ද, වාහනයේ දිග, පළල සහ උස සීමාවන් ද ප්‍රාදේශීය ඉංජිනේරු විසින් අදාළ මාර්ගවල තැනින් තැන පහසුවෙන් දැක ගත හැකි වන පරිදි විධිමත් පරිදි ප්‍රදර්ශනය කිරීම නීත්‍යානුකූල වන්නේය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

4. මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

09-411

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.